

වනජීවීන් සුරැකීම අද නිතර කතා බහට ලක් වන මාතෘකාවක් වන අතර වනජීවීන් සුරැකීමේ දී ඇති කරන හෝ වගා කරන සත්ව සහ ශාඛ විශේෂවලින් වනජීවීන් වෙන් කර හඳුනා ගැනීම අවශ්‍ය වෙයි.

# වනජීවීන් සුරැකීමේ දැනුම අවශ්‍යයි


සී.පී. කුරුප්පු

මේ සඳහා අපි කලක් තිස්සේ විවිධ සාධක භාවිත කර ඇත්තෙමු. එම සාධක අතර සමාජීය පසුබිම විශ්වාස ඇදහිලි සදාචාරාත්මක හැඟීම් සහ නීතිමය අවශ්‍යතාද වෙයි. එහෙත් එම සාධක කලින් කලට වෙනස් වනවා මෙන්ම වාද විවාදවලටද භාජනය වනු දැකිය හැකිය.

හින්දුන්ට ගවයන් සහ වඳුරන් සුද්ධ වූ සතුන් ය. අලි, ඇතුන්, අශ්වයන් උසස් සතුන් ලෙසත්, ඌරන්, මීයන් වැනි සතුන් පහත් ලෙසත් විශ්වාස කරන අය සිටිති. ඇතැම් ජන කොටස් ආගමික විශ්වාස මත සමහර සතුන් පිළිකුල් කරති. මේ අතර නීති පැනවීම මඟින් මරා දැමීම තහනම් කරනු ලැබ ඇති සත්ව සහ ජීවී කොටස් රැසක් ශ්‍රී ලංකාවෙන් වෙනත් රටවලත් සිටිති. වනජීවීන් සුරැකීමේ දී අද මුල් තැන ගන්නේ පාරිසරික නීති රීතිය එබැවින් පාරිසරික නීති සමඟ වනජීවීන් සුරැකීමේ නීති එකට බැඳී පවතියි. වනජීවින් යනුවෙන් අප පොදුවේ හඳුන්වනු ලබන්නේ වනයේ වසන සතුන්ය. එහෙත් අප ගෙවත්තේ වසන අප විසින් ඇති නොකරන සතුන් ද වග නොකරන පැලෑටි සහ ජීවී කොටස් ද වනජීවීන් ලෙස අපි හඳුන්වමු. කෙසේවුවත් මිනිසුන් සතුන් පැළෑටි සහ වෙනත් ජීවී කෙටස් සොබා දහම විසින් මුලින්ම නිර්මානය කරන ලද්දේ සංවිධිත පරිසරයක් තුළ නොව වනගත පරිසරයකයි.

කඳු නිම්න, තැනිතලා, වැසි වනාන්තර, කාන්තාර හිමෙන් වැසුන පෙදෙස් මිරිදිය ජලාශ සහ මහ සයුරෙහි ද වනජීවීහු වසති. මේ හැම වනජීවීයකුම කිසියම් රටාවකට අනුව පරිසරයකට අනුගත වන අයුරු අපි දැක ඇත්තෙමු. වනජීවීන් මිනිසා විසින් ඇති කළ හෝ වගා කළ හෝ ජීවීන් නොවෙතත් ඔවුන් සියල්ලන්ටම මිනිස් ක්‍රියාකාරකම් බලපායි. එම බලපෑම අතර දඩයම, කැලෑ එළි පෙහෙළි කිරීම සහ පරිසර දූෂණයද වෙයි.

ඈත අතීතයේ සිට එනම් දඩයම් යුගයේ සිට මිනිස්සු ආහාර පිණිස සතුන් දඩයම් කළහ. ශාක සහ වෙනත් ජීවී කොටස් එකතු කර ආහාරයට ගත්හ. මෙම ක්‍රියාවලිය තුළ ඇතැම් ජීවීන් විනාශ වී යන්නට ඇතැයි විද්‍යාඥයෝ විශ්වාස කරති. මිනිසා කෘෂිකර්මාන්තයේ නියැලීමත් සතුන් ඇති කිරීමට පටන් ගැනීමත් නිසා එම තත්වය සෑහෙන පමණ වෙනස් විය. එහෙත් ආහාරය සහ විනෝදය සඳහා සතුන් දඩයමත් මසුන් මැරීමත් අද ද සිදු වෙයි.



සතුන්ගේ සිරුරේ කොටස් භාවිත කර ඖෂධ නිපදවීම පිණිසත්, ලොම් සහ හම් ලබා ගැනීම පිණිසත් සතුන් මැරීම අද පවා කෙරී ගෙන යයි. ආහාරය විනෝදය සහ වෙනත් අවශ්‍යතා සඳහා සතුන් මැරීම සතුන් වඳවීමට හේතුවක් නොවේ. එහෙත් එක් වර්ගයක ජීවීන් අසීමිත ලෙස විනාශ වුවහොත් එම සත්ව වර්ගය වඳවී යනු ඇත. කිසියම් කාලගුණික හෝ පාරිසරික හේතුවක් නිසා මිහි මත විසූ ඩයිනෝසර් නමැති දැවැන්ත උරගයන් වඳවී ගිය බව දනිමු.

වනජීවීන්ගේ විනාශයට හේතු වන සාධක රැසක් ඇත. එයින් මුල් තැන ගන්නේ පමණට වඩා සතුන් මරා දැමීමය. මෙය බොහෝ විට දැකිය හැක්කේ කිසියම් සත්ව කොට්ඨාශයක උපන් සංඛ්‍යාවට වැඩියෙන් එම සතුන් දඩයම් කරන අවස්ථාවලයි. සෙමෙන් වැඩෙන සත්ව වර්ග කෙරෙහි මෙය තදින් බලපායි. කුඩා ප්‍රදේශයක ජීවත් වන සතුන් කෙරෙහි මෙම තත්වය වැඩියෙන් දැකිය හැකිය. වනජීවීන්ගේ නිජ බිම විනාශ කර දැමීම ඔවුන් විනාශ වීමේ තවත් සාධකයකි. ඉන්දුනිසියාවේ වනගත පෙදෙස්වල සිටින ඔරංඔටංගේ වාසයට තර්ජන එල්ල වුයේ පාම් ඔයිල් ශාඛය වගා කිරීමට එරට කැලෑ හෙළි කිරීමයි.

ජීවීන් වසන බිම් පෙදෙස් කැබලි කිරීම ගොවි පොළ සතුන් විසින් වන සතුන්ගේ ගොදුරු බිම් ආක්‍රමණය කිරීම, ලැව් ගිනි වන සතුන්ගේ නිජ බිම් සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනීමද ඔවුන් සහ ශාඛ වඳවී යෑමට මං පාදයි.

ශ්‍රී ලංකාවේ 1890 දී සියයට 70 ක්වු වන ගහනය අද වන විට සියයට 23 පමණ වන තෙක් පහත වැටී ඇත්තේ හේන් වගාව වතු වගාව ජනාවාස ඉදි කිරීම අනවසර හෙළි පෙහෙළි කිරීම සහ අනවසර කැලෑ කැපීම් නිසාය. වන ගහනයේ අඩු වීම ජීවීන්ගේ පැවැත්මට තර්ජනයක් වන බව නොරහසකි.

ජීවීන්ගේ නිජ බිම්වලට හඳුන්වා දෙනු ලබන ආන්තුක ජීවීන් නිසා නිජ බිම්වලට ආවේනික ජීවීන් වඳවී ගිය අවස්ථා දැක ගත හැකිය. මෙය සිදු වන්නේ ආන්තුක ජීවීන් ආක්‍රමණශීලි ලෙස ක්‍රියා කර ආවේනික ජීවීන් යටපත් කිරීමෙනි. ශ්‍රී ලංකාවට විදේශවලින් ගෙන්වන ලද සැල්වීනියා යෝධ නිදිකුම්බා වැනි පැලෑටි මෙරට පරිසරයේ වැඩෙන ආවේනික පැලෑටිවලට තර්ජනයක්වී ඇති බව අපි දනිමු.

ඉන්දියානු සාගරයේ මුරිසි දිවයිනට ගෙන්වනු ලැබූ ඌරන් එහි විසූ ඩෝ ඩෝ පක්ෂියාගේ බිත්තර කා දැමීම නිසා එම පක්ෂියා වඳවී යෑම සහ ඔස්ට්‍රේලියාවට හඳුන්වා දුන් රට හාවුන් එරට තණ බිම් විනාශ කරමින් පැතිරී යෑමත් උදාහරණ ලෙස දැක්විය හැකිය.

ඇතැම් ජීවීන් නව පරිසරවලට හඳුන්වා දෙනු ලැබුවත් ඔවුන් නව පරිසරයට අනුව හැඩ ගැසිය නොහැකිව විනාශ වී ගිය අවස්ථාද ඇත.

මේ අතර කිසියම් පරිසරයක වැඩෙන එක් ජීවීන් විශේෂයක වඳවී යෑම එම පරිසරයේ ම වැඩෙන තවත් ජීවීන් රැසකගේ වඳවී යෑමට බලපෑම කරන බවසොයා ගෙන තිබේ. මෙයට හේතුව ලෙස විද්‍යාඥයන් පෙන්වා දෙන්නේ එම ජීවීන් අතර පවත්නා සහ සබඳතාවයි. අප්‍රිකාවේ ජලාශ ආශ්‍රිතව වසන හිපොපොටෙමස් සහ උන්ගේ සිරුරේ වසන මැක්කන් සහ කිනිතුල්ලන් කා දමන කුරුල්ලන් අතර සහ සබඳකමක් පවතින බවත් හිපොපොටෙමස් මිය ගිය හොත් උන් නිසා ජීවත්වන කුරුල්ලන්ද මිය යන බවත් විද්‍යාඥයෝ පවසති.

වන ජීවී සම්පතට මිනිසා ගෙන් වැඩිම හානිය සිදුවී ඇත්තේ පසුගිය වසර දෙසියයක් තරම් මෑත කාලයේදී ය. අතිශයින් වැඩි දියුණු කරන ලද ගිනි අවි රසායනික ද්‍රව්‍ය සහ වෙනත් නවීන උපකරණ මෙම විනාශයට උදව් වී ඇත. මෙරට අලි පරපුර අද පවත්නා පහළ මට්ටමක ගෙන ඒමට ගිනි අවි උපකාරවූ බව ඓතිහාසික වාර්තා සනාථ කරයි. කලක් ඉන්දියාව නිජ බිම කර ගත් බළල් පවුලට අයත් චීටා ඉන්දියාවෙන් වඳවී ගියේ ඉවක් බවක් නැතිව එම සතාව වෙඩි තැබීම නිසාය. අම්ල වැසි නිසා මාළුවන් සහ සමනලුන් විනාශ වීයයි පෘථිවි උෂ්ණත්වය ඉහළ යෑම නිසා ජීවීන් විනාශ වන බවද ජෛව තාක්ෂණය පටක රෝපණය වැනි සාධක නිසාජීවීන් විනාශ වී යන බවද විද්‍යාඥයන් සොයා ගෙන තිබේ. වන ජීවීන්ට මුහුණ දීමට සිදුව ඇති විනාශය ගැන මුලු ලොවම දැන් ලොකු උනන්දුවක් දක්වයි. මෙම විනාශය අවම කර ගැනීම පිණිස රාජ්‍ය අංශයට අමතරව විවිධ පාරිසරික සහ සත්වාරක්ෂක සංවිධාන ද විශාල සේවයක් ඉටු කරයි. අද පරිසරය සුරැකීමේ වැදගත්කම පිළිබඳ දැනුම ලබා දෙන්නේ පාසල් මට්ටමේ සිටයි. ශ්‍රී ලංකාව ඇතුලු රටවල් බොහොමයක පාසල් විෂය මාලාවටද පරිසර විෂය ඇතුළත් කර තිබේ. මාධ්‍යයෙන් ද පරිසරය සුරැකීමට ලොකු අනුග්‍රහයක් ලැබෙයි පාරිසරික සංචාර ළමයින් මෙන්ම වැඩිහිටියන් වෙනුවෙන් ද සංවිධානය කෙරෙයි. එය ලොව පුරා ජනප්‍රිය සංචාරක අංගයක් පමණක් නොව හොඳ ධන ඉපයීමේ මාර්ගයක් බවට ද පත්වී තිබේ.

වන ජීවී සම්පතට මිනිසා ගෙන් වැඩිම හානිය සිදුවී ඇත්තේ පසුගිය වසර දෙසියයක් තරම් මෑත කාලයේදී ය. අතිශයින් වැඩි දියුණු කරන ලද ගිනි අවි රසායනික ද්‍රව්‍ය සහ වෙනත් නවීන උපකරණ මෙම විනාශයට උදව් වී ඇත. මෙරට අලි පරපුර අද පවත්නා පහළ මට්ටමක ගෙන ඒමට ගිනි අවි උපකාරවූ බව ඓතිහාසික වාර්තා සනාථ කරයි. කලක් ඉන්දියාව නිජ බිම කර ගත් බළල් පවුලට අයත් චීටා ඉන්දියාවෙන් වඳවී ගියේ ඉවක් බවක් නැතිව එම සතාව වෙඩි තැබීම නිසාය.